# සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල - 2025

## පළාත් මට්ටමෙන් ජාතික වටයට ඉදිරිපත් වන පාසල්වලින් ජාතික වටයේ සහතික පත්‍රවලට අවශ්‍ය තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දීම සඳහා උපදෙස්

මෙවර සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙලේ අවසාන වටයෙහි සම්මාන ස්ථාන ලබා ගන්නා සිසු දරු දැරියන්ට එම සහතික ලබා දීමට අමතරව, ජාතික වටයට සහභාගී වූ ඉතිරි සැමට සහභාගීත්ව සහතික ද ලබා දීමට තීරණය කර ඇත. සෞන්දර්ය තරග 7ක ජාතික මට්ටමේ සහතික විශාල සංඛ්‍යාවක් නිකුත් කිරීමේ දී ගත වන අධික කාලය අවම කර එම කටයුතු ඉතා කඩිනමින් සිදු කිරීම සඳහා, මෙවර පටන් පළාත් මට්ටමින් **ජාතික වටයට සහභාගී කරගන්නා** සියලු පාසල්වල අදාළ තොරතුරු කල් තබා ලබා ගැනීම සිදු කෙරේ. මෙහි දී පාසල්වල සහ සහභාගීවන්නන්ගේ නම් ආදි සියලු ම තොරතුරු මුද්‍රණය කෙරෙන බැවින් ඒවා නිවැරදිව සටහන් විය යුතු ආකාරය අදාළ පාසල් වෙතින් ම ලබා ගැනීම ද අත්‍යවශ්‍ය වී ඇත.

ඒ ඒ ශීර්ෂවලින් පළාත් මට්ටමින් ප්‍රථම ස්ථාන ලබා ගන්නා පාසල්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවියෙහි පළ කර ඇති MS Excel ගොනුව බාගත කරගෙන නිසි ලෙස පුරවා මේ සමග ඇති ඊමේල් ලිපිනයට **අවසාන තරගයට පෙර** එවිය යුතු ය. **සියලු තොරතුරු සහිතව** සහතික මුද්‍රණය කර පළමු අදියරේ දී ලබා දිය හැකි වන්නේ **ජාතික වටයට පෙර** එම තොරතුරු ඊමේල් මගින් එවන ලද පාසල්වලට පමණි.

අදාළ MS Excel ගොනුවට මෙම QR කේතයෙන් පිවිස එය බාගත කළ හැකි අතර, සපයා ඇති MS Excel ගොනුවට මෙම තොරතුරු පුරවා අමාත්‍යාංශය වෙත ඊමේල් මගින් එවීමට අදාළව පහත උපදෙස් පරිදි කටයුතු කරන්න. මෙහි දී එය කිසි සේත් ම PDF ලේඛනයක් වශයෙන් **නොඑවිය යුතු** අතර **MS Excel ගොනුවක් වශයෙන් පමණක්** එවිය යුතු වේ. QR කේතය මගින් යොමු වන සබැඳියෙන් අමාත්‍යාංශයීය නව වෙබ් අඩවියේ ‘‘සම්මාන සහ තරග’’ යන අංශයට ඔබව ප්‍රවේශ කරවන අතර, එහි පහළින් ඇති ‘‘සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල - (2025)’’ යන කොටසින් ඔබව මෙම ගොනුව බාගත කරගත හැකි සබැඳියට යොමු කරවනු ඇත.

**<u>MS Excel ගොනුවට තොරතුරු ඇතුළත් කිරීම</u>**

- **මෙහි සියලු තොරතුරු ඇතුළත් කළ යුත්තේ ඉංග්‍රීසි බසිනි.**
- පළමු තීරුවෙහි (Column A) ඔබගේ නිර්මාණ ඉදිරිපත් කරන කාණ්ඩයට අදාළ ඉලක්කම පමණක් සටහන් කරන්න. (කණ්ඩායමේ සියලු ම සාමාජිකයන්ට අදාළව මෙම තීරුවේ පහළට එම අංකය සටහන් කළ යුතු ය).
- දෙවන තීරුවෙහි (Column B) ඔබගේ නිර්මාණ ශීර්ෂ අංකය පමණක් සටහන් කරන්න. (කණ්ඩායමේ සියලු ම සාමාජිකයන්ට අදාළව මෙම තීරුවේ පහළට එම අංකය සටහන් කළ යුතු ය).
- තෙවන තීරුවෙහි (Column C) ඔබගේ නිර්මාණ ශීර්ෂ කාණ්ඩය කෙටි නාට්‍ය ද, නිර්දේශිත නාට්‍ය ද නැතහොත් ඒකල නිරූපණ ද යන්න ඉංග්‍රීසි බසින් පමණක් සටහන් කරන්න

- සිව් වන තීරුවෙහි (Column D) ඔබගේ විදුහලේ නම සහ එය පිහිටි ප්‍රදේශය **ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්** සටහන් කරන්න. විදුහලේ නමට පූර්වයෙන් එය අයත් **පළාත** සහ **කලාපය** දැක්වෙන සංකේත අක්ෂර සටහන් කළ යුතු වේ (කණ්ඩායමේ සියලු ම සාමාජිකයන්ට අදාළව මෙම තීරුවෙහි පහළට එය සටහන් කළ යුතු ය).

- පස් වන තීරුවෙහි (Columns E+F) නිර්මාණ ශීර්ෂයට සහභාගී වූවන්ගේ නම්, මුලකුරු සහ වාසගම වශයෙන් ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සටහන් කරන්න.

- හය වන තීරුවෙහි (Column G) ඒ ඒ සහභාගී වන්නා දායක වූ ක්ෂේත්‍රයට අදාළ **ඉංග්‍රීසි වචනය පමණක්** සටහන් කරන්න. [**Acting - (රංගනය) /Directing - (අධ්‍යක්ෂණය )/ Script Writing - (පිටපත් රචනය ) /Make Up - (අංග රචනය ) / Set Designing - (පසුතල නිර්මාණය ) / Costume Designing - (රංග වස්ත්‍ර නිර්මාණය ) / Make Up - (අංග රචනය ) / Music - (සංගීත නිර්මාණය/සංයෝජනය ) / Inst Accompaniment - (සහාය වාදනය )**
- **Vocal Accompaniment - (සහාය ගායනය ) /Choreography- (**රංග රචනය**) /Stage Management - (සහාය වාදනය ) / Training- (පුහුණුව)**].

- හත් වන තීරුවෙහි (Column H) ඒ ඒ සහභාගී වන්නාගේ ගුරු / සිසු බවට අදාළ **ඉංග්‍රීසි කැපිටල් අකුර පමණක්** සටහන් කරන්න. (**S** - සිසු / **T** - ගුරු).

<u>**සම්පූර්ණ කළ MS Excel ගොනුව ඊමේල් මගින් එවීම**</u>

- සම්පූර්ණ කළ තොරතුරු ඇතුළත් MS Excel ගොනුව SAVE කිරීමේ දී පළමුව නිර්මාණ ශීර්ෂ අංකයත් අනතුරුව පළාතත් ඉංග්‍රීසි බසින් සටහන් කර SAVE කරන්න.

- සම්පූර්ණ කළ තොරතුරු ඇතුළත් MS Excel ගොනුව aescompmoe@gmail.com දරන ඊ මේල් ලිපිනයට එවිය යුතු ය.

- එසේ ඊමේල් මගින් එවීමේ දී එම ඊමේල් පණිවිඩයේ **Subject** කොටස '**2025 Drama**' ලෙස සටහන් කර එවන්න.